# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / MY NO: 3/10/1/e-slims/2016 | ඔබේ අංකය / உமது இல / YOUR NO: | දිනය / திகதி / DATE: 2016.07. 14 |

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් සකස් කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බැහැර කර ඇති ඉඩම් සඳහා පූර්ණ අයිතිය සහිත ඔප්පු ලබා දීමේ ප්‍රතිපත්තිමය තීරණය කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහාත්, බෙදා දී ඇති සහ බෙදා දී නොමැති සියලුම රජයේ ඉඩම් පිළිබඳ විධිමත් දත්ත බැංකුවක් ඇති කිරීමේ ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීම සඳහාත්, රජයේ ඉඩම් පරිපාලනයට සෘජුව සම්බන්ධ වන ආයතන විසින් තමන් භාරයේ ඇති ඉඩම් පිළිබඳ නිශ්චිත තොරතුරු පද්ධතියක් තුළ රැස් කර පවත්වාගෙන යා යුතු බවට උපදෙස් ලැබී ඇත.

ඒ සඳහා දැනටමත් ක්‍රියාත්මක වනු ලබන රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (e-Slims) යොදා ගත යුතු බවත්, එහි ක්‍රියාකාරීත්වය වේගවත් කර ඉලක්ක ළඟා කරගත යුතු බවත්, අවධාරණය කර ඇත. මේ අනුව 2016 ඔක්තෝබර් මස අවසානය වන විට සියලුම රජයේ ඉඩම් පිළිබඳ දත්ත මෙම තොරතුරු පද්ධතියට ඇතුලත් කර අවසන් කළ යුතු බවට ඉලක්කයක් ලබා දී ඇත. අප වෙත පැවරී ඇති මෙම අභියෝගාත්මක ඉලක්කය සම්පූර්ණ කිරීම සඳහා ඔබ විසින් පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් ඔබ කොට්ඨාශයේ ඇති සියලුම බෙදා දුන් සහ බෙදා දී නොමැති රජයේ ඉඩම් (විවිධ රාජ්‍ය ආයතන භාරයේ පවතින රජයේ ඉඩම් ද ඇතුළුව) e-Slims තොරතුරු පද්ධතිය තුළට ඇතුලත් කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් මෙතැන් සිට ආරම්භ කළ යුතුයි.

**01.** කාර්ය මණ්ඩලය යොදා ගැනීම.

මේ සඳහා ඔබේ කාර්යාලයේ ඉඩම් අංශයේ නිලධාරීන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් යොදාගත යුතු අතර ඉඩම් අංශයේ නිලධාරීන් ප්‍රමාණවත් නොවේ නම් වෙනත් අංශවල සිටින සංවර්ධන නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් ද මාස කිහිපයකට තාවකාලිකව යොදා ගත හැකියි. ක්ෂේත්‍රයේ කටයුතු සඳහා ද ජනපද නිලධාරීන්, ක්ෂේත්‍ර උපදේශකවරුන්, ග්‍රාම නිලධාරීන් යොදා ගත යුතු අතර එම නිලධාරීන් ප්‍රමාණවත් නොවන්නේ නම්, සංවර්ධන නිලධාරීන් වැනි වෙනත් නිලධාරීන්ද ඒ සඳහා තාවකාලිකව යොදා ගත හැකිය.


දුරකථනය / தொலைபேசி / Telephone: 011-2797400 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051 | වෙබ් ලිපිනය / இணையம் / Web Address: www.landcommdept.gov.lk | ඊමේල් / ஈ-மெயில் / E-mail: landcom@landcommdept.gov.lk

මෙතෙක් පුහුණුව ලබා දී නොමැති නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීමේ කටයුතු ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**02. අවශ්‍ය සම්පත් හා පහසුකම් ලබා දීම.**

මෙම වැඩසටහන මඟින් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ඉඩම් අංශය සඳහා පහත සඳහන් උපකරණ සපයනු ලැබේ. දැනටමත් සපයා දී නොමැති කාර්යාලවලට ඉදිරි සති කිහිපය තුළදී මෙම උපකරණ සපයා දෙනු ලැබේ.

I. පරිගණකයක්

II. ඇන්ඩ්‍රොයිඩ් ටැබ්ලට් උපකරණයක්

III. අන්තර්ජාල සබඳතාවයක්

ඊට අතිරේකව කාර්යාලයේ ඇති උපකරණ මේ සඳහා ප්‍රමුඛතාවය දී යොදා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, මෙම වැඩපිළිවෙල වේගවත් කිරීමේ අපේක්ෂාවෙන් දිරිගැන්වීමේ දීමනාවක් ද ලබා දීමට අපේක්ෂිත බැවින් මේ සඳහා යොදා ගනු ලබන නිලධාරීන්ට තම පෞද්ගලික ඇන්ඩ්‍රොයිඩ් ටැබ්ලට් උපකරණ හෝ ජංගම දුරකථන මෙම කාර්යය සඳහා යොදා ගැනීමට ඉඩදිය හැක. ඒ අනුව කැමති නිලධාරීන්ට තම උපකරණ සඳහා වැඩසටහන් මෘදුකාංග ඇතුලත් කර දීමට ක්‍රියා කරනු ලැබේ.

මෙම සියලුම උපකරණවලට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් ලබාදෙනු ලබන අතර ඇතුලත් කරනු ලබන දත්ත ප්‍රමාණයන් පදනම් කරගෙන අන්තර්ජාල සම්බන්ධතාවයන්ට අදාල බිල්පත් මෙම දෙපාර්තමේන්තුව මඟින් පියවනු ලැබේ. ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන නිලධාරීන්ට ගමන් වියදම් ආදිය ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ.

**03. රජයේ ඉඩම් කැබලිවල තොරතුරු ඇතුළත් කිරීම.**

රජයේ ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු e-Slims පද්ධතියට ඇතුලත් කිරීම පියවර දෙකක් යටතේ සිදු කළ යුතුය. එනම්,

**I. මූලික ඉඩම් තොරතුරු ඇතුලත් කිරීම.**

මෙහිදී කාර්යාලීය ලිපිගොනුවල පවතින තොරතුරු පද්ධතිය මඟින් ලබා දී ඇති නියමිත ආකෘතියට අනුව, පද්ධතියට අදාල ඉඩම් කැබැල්ල පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම සිදුකළ යුතුය. තොරතුරු ඇතුලත් කිරීමේදී අදාල ලියකියවිලි හොඳින් පරීක්ෂාකර නිවැරදිව ඇතුලත් කිරීම සිදුකළ යුතුය.

**II. සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් කිරීම.**

ඇන්ඩ්‍රොයිඩ් ටැබ්ලට් උපකරණය හෝ ජංගම දුරකථනය භාවිත කරමින් ක්ෂේත්‍රයට ගොස් අදාල ඉඩම පරීක්ෂා කර GPS ඛණ්ඩාංක මඟින් ඉඩමෙහි අනුරේඛනයක් (KML file) සකස් කර පද්ධතියට ඇතුලත් කිරීමත්, ඉඩම හා එම ඉඩම අයත් කැනැත්තන්ට අදාල තොරතුරු, පද්ධතියට ඇතුළත් කර වර්තමාන තොරතුරු වලින් පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කළ යුතුය.

එමෙන්ම අදාල නීත්‍යානුකූල ලියකියවිලි පරිලෝකනය (Scan) කර පද්ධතියට ඇතුලත් කර එහි ගබඩා කිරීම (Upload) සිදු කළ යුතුය.

මෙසේ පියවර දෙකකින් ඇතුලත් කරනු ලබන දත්ත පරීක්ෂා කර නිවැරදිතාවය තහවුරු කරගෙන, ඒවා අනුමත කිරීම ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කළ යුතුය. දත්ත ඇතුලත් කරනු ලබන වේගයට සමගාමීව මෙම දත්ත අනුමත කිරීම ද සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් දිනකට යම් කාලයක් වෙන්කර ගනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ඔබේ කොට්ඨාශයේ ඇති මුළු ඉඩම් කැබලි ප්‍රමාණය සැලකිල්ලට ගෙන මාස 3 ක් ඇතුලත සියලුම ඉඩම් කැබලි ප්‍රමාණය තොරතුරු පද්ධතියට ඇතුලත් කර අවසන් කිරීම් සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් එක් එක් කාර්යයන් සඳහා අදාල නිලධාරී සනයන්ගෙන් යොදා ගැනීමට පියවර ගන්න. මෙම කාල සීමාව තුළ මේ සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දී මෙම කාර්යය අවසන් කිරීම තුළින් ඉඩම් සම්බන්ධ ඔබේ ඉදිරි රාජකාරි කටයුතු ඉතාමත් පහසුවන බව ද, සැලකිය යුතුයි.

ඉඩම් සංවර්ධන ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බැහැර කර ඇති ඉඩම් සඳහා පූර්ණ අයිතිය සහිත ඔප්පු ලබා දීමේ ප්‍රතිපත්තිමය තීරණය කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා; ඔබගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙම පනත් දෙකට අදාලව බැහැර කර ඇති ඉඩම් කැබලිවල එකතුව, දැනටමත් ඔබ විසින් පද්ධතියට තොරතුරු ඇතුලත් කර ඇති ප්‍රමාණය (මූලික ඉඩම් තොරතුරු, සවිස්තර ඉඩම් තොරතුරු හා තොරතුරු අනුමත කිරීම/ ප්‍රතික්ෂේප කිරීම යනාදී ලෙස) හා ඉදිරියේදී දත්ත ඇතුලත් කිරීමට ඇති ප්‍රමාණය හා ඒ සඳහා යෝජිත ඉලක්ක මේ සමග අමුණා ඇත. මෙම ඉලක්ක ලබා දීමේ දී නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනේ ඉලක්ක ද, සැලකිල්ලට ගෙන ඇති බව සලකන්න.

මෙම ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා හැකි සෑම උපක්‍රමයක්ම අනුගමනය කරමින් ඔබේ උපරිම සහාය මේ සඳහා ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

(අත්සන)

ආර්.පී.ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම් : කා.දැ.පි.
2. අග්‍රාමාත්‍ය ලේකම් : කා.දැ.පි.
3. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය : කා.දැ.පි.
4. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය : කා.දැ.පි.
5. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය : කා.දැ.පි.
6. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි සංවර්ධන අධිකාරිය : අ.ක.ස.
7. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් : ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යසාධන ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් සහාය වීමට
8. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් : වැඩසටහන සම්බන්ධීකරණය කිරීමට